නිදහස් පක්ෂයේ අයට සහ අනෙකුත් දේශපාලන මත දරන්නන් සියලු දෙනාටම පීඩාවක් වෙලා තියෙනවා අද තියෙන විධායක ක්‍රමය, ඒ නිසා ඒ අය එකතුකරගෙන පොදු ක්‍රියාවකට යන්න ඕන කියන ස්ථාවරයේ අපි ඉන්නවා. හැබැයි පොදු අපේක්ෂයෝ කවුද එහෙම කෙනෙක් කරනවද මේක කරන්නෙ කියලා තීරණයකට තවම අපි ඇවිත් නෑ. මොකද ජනාධිපතිවරනය තියෙන දිනයක්, කාලයක් තීන්දු කරලා නැති නිසා දැන්ම පුද්ගලයින් නම් කිරීම අනවශ්‍යයි කියලා අපි හිතන්නේ නෑ.

නමුත් ජනාධිපතිවරණය සඳහා කාල වකවානු සූදානම් කර නිවේදනයක් නිකුත්වෙනවානම් අපි ඒ සඳහා නොපමාව සූදානම් වෙනවා.

**හොඳයි මේ කෙටි කතා බහේදී ඔබ නොයෙක් දේගැන කරුණු ඉදිරිපත්කලා අවසන් වශයෙන් මා දැනගන්න කැමතියි සමස්ථයක් වශයෙන් අද රටේ පවතින තත්වය ඔබ දකින්නේ කොහොමද ?**

ඇත්තටම ලංකාවේ ක්‍රියාත්මක වෙන්නේ ඒකාධිපති පවුල් පාලනයක් එය වෙනස්කලයුතුයි. එය ප්‍රජාතන්ත්‍ර විරෝධියි, සමාජ විරෝධියි, ජනතා ද්‍රෝහී. ඒකට එරෙහිව අපි රටතුල උපරිමයෙන් මැදිහත්වෙනවා. ඊට එරෙහිව සටන් වදිනවා, රටතුල පමනක් නෙවෙයි විදේශවල ජීවත්වන ශ්‍රී ලාංකීය පිරිස සංවිධානය කරගනිමින් ඊට එරෙහිව මැදිහත් වෙනවා.

අපේ අරමුන ඉන් පැහැදිලියි ශ්‍රීලංකාව ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කලයුතුයි සැබෑ ජනතාවාදී පාලකයන් ඇතිකල යුතුයි. ඒ සඳහා මේ විධායක ජනාධිපතික්‍රමය වහා අවසන් කල යුතුයි.

විධායක ජනාධිපතික්‍රමය අහෝසිකරලා පාර්ලිමේන්තුවේ අද තියෙන පක්ෂ මාරු කිරීම් ක්‍රමවේදයන් නීතියෙන් තහනම් කරලා, ඒ වගේම ලෝකයේ විශාලතම අමාත්‍ය මංඩලය සීමා කරලා අපි කියනවා 25කට සීමා විය යුතුයි කියලා. ඒ විතරක් නෙවෙයි නීතිය විධානය අද රටේ මුළුමනි න්ම බිඳවැටිලා අද රටේ නීතයක් නෑ රාජපක්ෂ කැමැත්ත තමයි රටේ නීතිය නීතිය බල්ලට ගිහිල්ලා, තම පැත්තකින් ආර්ථික වශයෙන් රට විනාශයට ඇදවැටිල මෙන්න මේ තත්වය වෙනස්කි රීම සඳහා මැදිහත්වීමක අපි ඉන්නවා. ඒ සඳහා ඉදිරියේදී ගත හැකි, ගතයුතු ඕනෑම ආකාරයක දේශපාලනික උපක්‍රමයකට යන්න අපි සූදානම්. ඒ දේශපාලනික උපක්‍රම හරහා පමනයි විධායක ජනාධිපතික්‍රමය අවසන් කරන්න පුළුවන් වෙන්නේ. ඒකට අපි අදත් හෙටත් සූදානම්, එතනින් එහාට ගිහින් රට ගොඩනැගීම සඳහා මහා දැවැන්ත මෙහෙයුමක් සිදුකල යුතුව තිබෙනවා. අන්න ඒ නිසා තමයි අපි අදත් හෙටත් මේ දේශපාලනය කරන්නේ.




## ස්වර්ණකාන්ති රාජපක්ෂ ගේ පොකුරු මල් වීදිය එළිදැක්වුණ දා

පවීණ ලේඛිකා ස්වර්ණකාන්ති රාජපක්ෂ මහත්මියගේ නවතම පරිවර්ත න කෘතිය වන පොකුරු මල් වීදිය එළි දැක්වීමේ උළෙල පසුගියදා මවුන්ට් වේවර්ලි යූත් සෙන්ටර් ශාලාවේදී පැවැත්වුණි.

රාජ්‍ය සම්මානලාභී ලේඛිකාවක වන ස්වර්ණකාන්ති මේ වන පිට පොත් විස්සකට අධික සංඛ්‍යාවක් මුද්‍රණයෙන් එළි දක්වා ඇත. මේ එම උත්සවයේ අවස්ථා කීපයකි.

ස්වර්ණකාන්ති අභාවප්‍රාප්ත සිරිල් ධර්මවර්ධන කලාකරුවාගේ ආදරණීය බිරිඳයි.



ගරු නාඹටුන්නේ විජිත ස්වාමින්වහන්සේට පොත පිළිගන්වමින්






වියත් ලේඛක ශ්‍යාමන් ජයසිංහ මහතා ස්වර්ණකාන්තිගේ පොත් පිළිබඳව අදහස් දක්වමින්



ප්‍රවීණ ගීත රචක සිසිර දිසානායක උත්සවය මෙහෙයවමින්



ලේඛක ජගත් ජේ එදිරිසිංහ "පොකුරු මල් වීදිය" පොත පිළිබඳව අදහස් දක්වමින්



සරසවි ප්‍රකාශන ආයතනය පොත ලේඛිකාවට පිළිගන්වමින්

## Commemoration of Heroes Day

A series of Dhamma Sermons and a Sangika Dhane was organised by some of the Srilanka Ex service and Police persons in Melbourne to mark the 5th anniversary of liberating Srilanka from the three decades long terrorist war.

This was done to invoke merits to all who had made the supreme sacrifice while defending our motherland.

The Sangika Dhane and Dhamma sermons were held in the Dhamma Sarana temple in Keysborough on the 17th May and 18th May 2014. The event concluded very successfully. On behalf of the organizing committee, I would like to thank you all who supported us to make this meritorious event a successful one!

By Colonel Kalinga Gunaratne





